සැ. යු. - මෙවර පළවන ගැසට් පත්‍රයේ V කොටසේ 2004 වර්ෂයේ අප්‍රේල් - ජුනි කාර්තුවට අදාල පොත් නාමාවලිය ද, VI කොටසේ වෛද්‍ය, දන්ත වෛද්‍ය සහ ශල්‍ය වෛද්‍ය වෘත්තිකයින්ගේ නාම ලේඛනයන් ද වෙන් වෙන්ව ඉංග්‍රීසි භාෂාවෙන් පළවේ.


# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,547 - 2008 අප්‍රේල් මස 25 වැනි සිකුරාදා - 2008.04.25

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස : (IIඅ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු - ඇබෑර්තු ... ... ... ... | 444 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 445 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයෙහි* සෑම කොටසකටම අග පිටුවෙහි සෑම මාසයකම මුල් සතියේ දී පළ කරනු ලබන ගැසට් නිවේදන බාර ගන්නා අවසාන දිනය සහ වේලාව සඳහන් නිවේදන කෙරෙහි ඔබගේ අවධානය මින් යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* සෑම කොටසකම පළකළ යුතු ගැසට් නිවේදන භාර ගන්නා වේලාව, *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන සිකුරාදා දිනට සති දෙකකට පෙර එළඹෙන සිකුරාදා දිනයෙහි දහවල් 12 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, ටෙන්ඩර් දැන්වීම්, වෙන්දේසි පිළිබඳ දැන්වීම් යනාදියෙහි සඳහන් කරනු ලබන අවසාන දිනය සහ වේලාවත් ඊට අනුරූපව - එනම් දැන්වීම්, රජයේ මුද්‍රණාලයට එවන සහ එම් දැන්වීම්, පළ කරන දින අතර සෑහෙන කාල වේලාවක් දෙමින් එම දැන්වීම්වල සඳහන් කරුණු කෙරෙහි උනන්දුවක් දක්වන සෑම කෙනෙකුටම ප්‍රයෝජනවත් වන පරිදි ඊට සහභාගිවීමට ඉඩ ප්‍රස්ථාවක් සැළසෙන සේ සකස් කරන මෙන් සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල යනාදියෙන් මින් ඉල්ලා සිටිනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම පිණිස එවන සෑම දැන්වීමක්ම *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන දිනට සති දෙකකට පෙර - එනම් 2008 මැයි මස 02 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයට* යා යුතු දැන්වීම් 2008 අප්‍රේල් මස 18 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර රජයේ මුද්‍රණාලයට ලැබෙන සේ එවිය යුතුය.

**ලක්ෂ්මන් ගුණවර්ධන,**
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

2008 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින්ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතුය. (1961 ජනවාරි මස 1 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරින් විෂයෙහි මෙම නියමය අදාළ නොවන්නේය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලකදී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත් දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

**2. සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලුම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරින්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකිය.

2.3 දිවයිනේ ඕනෑම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

**3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරින්ට අදාළ සේවා කොන්දේසි :**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වන වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අනිකුත් කොන්දේසිවලටද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලුම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලුම රාජ්‍ය නිලධාරිහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරින්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේදී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීනතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකිය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාල සීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරින්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැළසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමගම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්විමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාල සීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකිය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නාවූද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

**4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි :**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරින් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යයි ආණ්ඩුව විසින් නියම කරනු ලබන ප්‍රතිශතක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරින් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේය. මුදල් වර්ෂය අවසානයේදී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නාවූ නිලධාරින් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නාවූ නිලධාරින් හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදලා හරිණු ලැබූ යුද්, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාව යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාල සීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව ඇත්ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතුය.

**5. යුද්ධ සේවා අනුග්‍රහය :**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේව මුක්ත භටයින් ද, සහය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයටද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැදී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම්ද, ඔවුන්ගේ එස සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම්ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 3 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනිදා දක්වා වූ කාල සීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

**6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරිහු :**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරින් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ, දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නාවූ ද, නිලධාරින්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකිද යන්න එම නිලධාරින් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතුය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතුය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුවද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කළින් දැනට ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත් තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින්ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම :**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේය.

**8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය :**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 දින සිට සිදුකරනු ඇත.

# විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියළුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලුම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ට අභිමත පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබේ.

i. මුළු විභාගයම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසට හෝ පෙනී සිටීම හෝ තහනම් කිරීම.
ii. විභාගයේ එක් විෂයයකට හෝ මුලු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම.
iii. එක් අවුරුදු හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම.
iv. මුළු ජීවිත කාලයේම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම.
v. සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම.
vi. විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වග කිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයාගේ පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුරු හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතුවේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටතේ වන්නේය.

1. සියළුම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසළදීත් විභාගශාලාධිපතින්ට ද, ඔහුගේ සහාකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාගශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාගශාලාධිපතින්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතුය.

3. විභාගයේදී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුලු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමාවී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාශාලාධිපතිනේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට අවකාශයකි.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන්ම නිශ්ශබ්දව සිටිය යුතුය. මොනම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දි විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත් හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරිම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීම් ආදියත් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාගශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතුයි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයන්ත දැරීමක් ලෙස සළකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමටද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමකැයි සැළකිය හැකිවේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩි ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතුය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතුය. (එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේදී ලියන ලද කියන

9. ගණිත ප්‍රශ්නවලදී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමක් චිත්‍ර කර්මයේදී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සළකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේදි උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැළකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපි ද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොල හො කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවු ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොත් පතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයාම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්ත දැරීමක් ලෙස සළකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොත පතකින් හෝ ප්‍රතයකින් හෝ සටහන් සහිත කොලයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම හොර උත්තර ලීවීමට ද, යන්න දැරීම තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසි යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකුටම ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේදී පිළිතුරු පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත් කෙනෙකුගේ අනන්‍යතා සහතිකයේ වෙනස් කිරීමක් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයනී එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සළකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතුය.

i. විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන් පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටතේ පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කළින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

ii. යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාගශාලාධිපතින්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගපේක්ෂකත්වය අවලංගුවී යාමට හේතු විය හැකිය.

iii. විභාගයට පෙනී සිටීමේදී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේදී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතින්නට දන්වා විභාග අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

iv. විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපි ද්‍රව්‍ය (එනම්, ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මොස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේදී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුසණක චක්‍ර සපයන ලද නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

v. විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කුඩු, මකන, රෙදි කෑළි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

vi. තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේදී නොපමාව තන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිය යුතුයි.

vii. උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තිරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

viii. අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

ix. ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව සෑහෙන පමණ විශාලවද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවලදී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවලදීත් ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

x. එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරවල් තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

xi. ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතින්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩිවී සිටිය යුතුය. මෙසේ නොකරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැතිවී යාමටද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවුවකු සේ සලකණු ලැබීමටද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයකුට හෝ බාර නොදිය යුතුය.

xii. යම්කිසි කරුණත් නිසා විභාග ශාලාධිපතින්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විටද කඩදාසි ආදිය අවශ්‍ය වූ විටද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

විභාග කොමසාරිස් ජනරාල්.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
පැලවත්ත,
බත්තරමුල්ල.

# තනතුරු - ඇබෑර්තු

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු - කුරුණෑගල දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාශවල ඇති විවාහ, උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ :

02. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාශ තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපලක් හිමි ප්‍රදේශ වාසීන්ගේ සැලකිල්ල ලබන අයද විය යුතුය.

03. මෙම තනතුරු සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම ඉල්ලුම් කළ හැකිය.

04. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 21ට අඩු නොවිය යුතු අතර, අවුරුදු 65ට වැඩි නොවිය යුතුය.

05. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතුය.

06. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමූපකාර සමිති ආදී කොට්ඨාශයේ ප්‍රසිද්ධ ස්ථාන වල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම් වලින් බලාගත හැකිය.

07. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාල දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැක.

08. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2008 මැයි මස 23 දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපැල් මඟින් යැවිය යුතුය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2008 අප්‍රේල් මස 03 වැනි දින,
කොළඹ 11, කෙලින් වීදිය, අංක 280,
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

*උපලේඛනය*

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාශය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| කුරුණෑගල | කොබෙයිගනේ | බලදොර කෝරලේ කොට්ඨාශයේ උප්පැන්න, මරණ හා දේවමැදි හත්පත්තුව කොට්ඨාශයේ විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කුරුණෑගල |
| එම | අඹන්පොල | ගන්තිහ කෝරලේ අඹන්පොල කොට්ඨාශයේ උප්පැන්න, මරණ සහ වන්නිහත්පත්තුව කොට්ඨාශයේ විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | එම |
| එම | නාරම්මල | දඹදෙණි උඩුකහ බටහිර කොට්ඨාශයේ උප්පැන්න, මරණ හා දඹදෙණි හත්පත්තුව කොට්ඨාශයේ විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | එම |
| එම | කුලියාපිටිය (බටහිර) | මයුරාවතී කෝරළය කොට්ඨාශයේ උප්පැන්න, මරණ හා කටුගම්පල හත්පත්තුව කොට්ඨාශයේ විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | එම |
| එම | අඹන්පොල | ගන්තිහ කෝරලේ කිරිමැටියාව කොට්ඨාශයේ උප්පැන්න, මරණ සහ වන්නිහත්පත්තුව කොට්ඨාශයේ විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | එම |

04-571

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**වෘත්තීය හා කාර්මික පුහුණු අමාත්‍යාංශය**

ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය

***ඉංජිනේරු තාක්ෂණ ආයතනය (පෙර තාක්ෂණඥයින් පුහුණු කිරීමේ ආයතනය) - කටුනායක***

***ඉංජිනේරු විද්‍යා ජාතික ඩිප්ලෝමා පාඨමාලාව සඳහා ඉංජිනේරු විද්‍යා විශේෂ ආධුනිකයන් බඳවා ගැනීම - 2008 කණ්ඩායම***

කටුනායක, ඉංජිනේරු තාක්ෂණ ආයතනයේ (පෙර තාක්ෂණඥයින් පුහුණු කිරීමේ ආයතනය) ඉංජිනේරු විද්‍යා ජාතික ඩිප්ලෝමා පාඨමාලාව, 2008 කණ්ඩායම සඳහා ඉංජිනේරු විද්‍යා විශේෂ ආධුනිකයන් බඳවා ගැනීම පිණිස ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් මෙයින් අයදුම්පත් කැඳවනු ලැබේ.

1. *ඇතුළත් කර ගැනීම සඳහා අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම් :*

පහත දක්වා ඇති සුදුසුකම් සහිත අයදුම්කරුවන්ට අයදුම්පත් ඉදිරිපත් කළ හැක :

1.1 අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී එකවර විෂයයන් 06කින් සාමාර්ථය ලබා සිටීම සහ විද්‍යාව, ගණිතය සහ භාෂාව යන විෂයයන් සඳහා සම්මාන සාමාර්ථ ලබා තිබිය යුතුය ;

සහ

1.2 අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ - නව නිර්දේශය) විභාගයේ දී සංයුක්ත ගණිතය, භෞතික විද්‍යාව සහ රසායන විද්‍යාව යන විෂයයන් තුන (03) එකවර සමත්වීම.

2. *වයස* : 2008.12.01 වැනි දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ 25ට නොවැඩි විය යුතුය.

3. *පුහුණු කිරීමේ කාලය පිළිබඳ වැඩසටහන් විස්තර :*

මෙම පාඨමාලාවේ කාලය වසර හතරකි. සති 73ක (ආසන්න වශයෙන්) න්‍යායික උපදෙස් පාඨමාලාව, සති 135ක (ආසන්න වශයෙන්) ප්‍රායෝගික පුහුණුව සමග පහත දැක්වෙන ආකාරයට සකස් කර ඇත :

මූලික උපදෙස් වැඩසටහන (කඩිනම් ඉංග්‍රීසි පාඨමාලාව සහිතව)

| | |
|---|---|
| ඉංජිනේරු තාක්ෂණ (ඉ.තා.) ආයතනයේ දී | - සති 27 |
| මූලික ආයතනික ක්ෂේත්‍ර පුහුණුව කර්මාන්ත ආයතනයේ දී | - සති 39 |
| සාමාන්‍ය උපදෙස් වැඩසටහන ඉ.තා. ආයතනයේදී | - සති 23 |
| සාමාන්‍ය ආයතනික ක්ෂේත්‍ර පුහුණුව කර්මාන්ත ආයතනයේ දී | - සති 52 |
| විශේෂ උපදෙස් වැඩසටහන ඉ.තා. ආයතනයේ දී | - සති 23 |
| විශේෂ ආයතනික ක්ෂේත්‍ර පුහුණුව කර්මාන්ත ආයතනයේ දී | - සති 44 |

මෙම ඉංජිනේරු පාඨාමාලාවට අයත් න්‍යායික උපදෙස් හා පාඨමාලා ප්‍රායෝගික කාර්යයන් මෙම ආයතනයේදී ලබා දෙන අතර ආයතනික ක්ෂේත්‍ර පුහුණුව පිළිගත් කර්මාන්ත ආයතන මගින් ලබා දෙනු ඇත.

4. ආයතනය මගින් පවත්වනු ලබන පාඨමාලා පහත සඳහන් පරිදි වේ:

*(අ) සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රය :*

1. ගොඩනැගිලි හා ව්‍යුහ ඉංජිනේරු පාඨමාලාව
2. මහා මාර්ග හා දුම්රිය මාර්ග ඉංජිනේරු පාඨමාලාව
3. ජල හා පාරිසරික ඉංජිනේරු පාඨමාලාව

*(ආ) විදුලි ඉංජිනේරු ක්ෂේත්‍රය :*

4. විද්‍යුත් ඉංජිනේරු පාඨමාලාව
5. විදුලි බල ඉංජිනේරු පාඨමාලාව
6. විදුලි සංදේශ ඉංජිනේරු පාඨමාලාව

*(ඇ) යාන්ත්‍රික ඉංජිනේරු ක්ෂේත්‍රය :*

7. යාන්ත්‍රික (ස්වයංචලන) ඉංජිනේරු පාඨමාලාව
8. යාන්ත්‍රික (සාමාන්‍ය) ඉංජිනේරු පාඨමාලාව
9. නාවික ඉංජිනේරු පාඨමාලාව

*(ඈ) පරිගණක ඉංජිනේරු ක්ෂේත්‍රය :*

10. පරිගණක මෘදුකාංග ඉංජිනේරු පාඨමාලාව
11. පරිගණක දෘඩාංග හා ජාලකරණ ඉංජිනේරු පාඨමාලාව

*(අ)* ඉංජිනේරු තාක්ෂණ ආයතනයේ නාවික ඉංජිනේරු පාඨමාලාව (අංක 9) තත්ත්ව කළමනාකරණ පද්ධතිය ISO 9001-2000 හි දක්වා ඇති අවශ්‍යතා පරිදි පැවැත්වේ.

*(ආ)* නාවික ඉංජිනේරු පාඨමාලාව සැලසුම් කොට ඇත්තේ අන්තර්ජාතික සමුද්‍ර සංවිධානයේ එස්ටීසීඩබ්ලිව්-95 සහ 7.04 ආදර්ශ පාඨමාලාව හා සම්බන්ධිත නාවික ඉංජිනේරු කාරක මට්ටමේ දැනුම, අවබෝධය සහ ප්‍රවීණතාව පිළිබඳ විධානානුකූල අවශ්‍යතා සපුරාලනු පිණිස වේ.

5. *උපදෙස් මාධ්‍යය* : මෙම පාඨමාලා පවත්වනු ලබන්නේ ඉංග්‍රීසි භාෂාවෙනි.

6. *ආධුනිකත්ව ගිවිසුම :*

6.1 තෝරාගනු ලබන සෑම ආධුනිකයෙකු විසින්ම ආධුනිකයා, ඉංජිනේරු තාක්ෂණ ආයතනය සහ පුහුණු කිරීමේ ආයතනය යන තිදෙනා වෙතම අන්‍යෝන්‍යය වගකීම් පැවරෙන විශේෂ ආධුනිකත්ව ගිවිසුමකට ඇතුළත් විය යුතු අතර පාඨමාලාවට ලියාපදිංචි වන අවස්ථාවේදී, පාඨමාලාව අවසානයේ ආපසු ගෙවනු ලබන රුපියල් 5,000 ක තැන්පතු මුදලක් ලබා දිය යුතුය. පාඨමාලාව අතරමග හැර යන සිසුන්ට මෙම මුදල ආපසු ගෙවනු නොලැබේ.

6.2 කර්මාන්ත පුහුණු අවස්ථාවලදී ආධුනිකයා සහ පුහුණු ආයතනය අතර ආධුනිකත්ව ගිවිසුමකට ඇතුළත් විය යුතුය.

6.3 පුහුණුව අවසාන වීමෙන් පසුව ආධුනිකයින් සඳහා රැකියා සැපයීමට ආයතනය බැඳී නොමැත.

6.4 මෙම පාඨමාලා සඳහා ලියාපදිංචි වන සියළුම සිසුන් මුළු පාඨමාලා කාලය තුළ 80% අවම පැමිණීමේ ප්‍රතිශතයක් පවත්වාගෙන යා යුතුය. එසේ නොවන අවස්ථා වලදී අදාල විභාග වලට පෙනී සිටිය නොහැකි අතර ඔවුන්ට එම කණ්ඩායමෙන් ඉවත්වී පසු කණ්ඩායම සමග අධ්‍යයන කටයුතු කිරීමට සිදුවේ.

7. *සහතික ප්‍රදානය :*

සාර්ථක ලෙස පුහුණුව අවසන් කර සමත්වන ආධුනිකයන් හට ඉංජිනේරු විද්‍යා ජාතික ඩිප්ලෝමා සහතිකය ප්‍රදානය කරනු ඇත.

8. *තෝරාගැනීමේ ක්‍රමය :*

8.1 ඉහත අංක 1 ඡේදයෙහි සඳහන් ඇතුළත් කර ගැනීම සඳහා වූ අවම සුදුසුකම් සහිත අංක 2 ඡේදයෙහි සඳහන් වයස සීමාව තුළ වූ අයදුම්කරුවන්ගෙන් පහත දැක්වෙන ක්‍රමයට තෝරාගැනීම සිදුකරනු ලැබේ.

8.2 මූලික සුදුසුකම් සපුරා ඇති සියලුම අයදුම්කරුවන් ඉංග්‍රීසි මාධ්‍යයෙන් වූ ලිඛිත යෝග්‍යතා පරීක්ෂණයකට පෙනී සිටිය යුතුය. (ලිඛිත යෝග්‍යතා පරීක්ෂණය - සඳහා සුදුසුකම් ලබන සියලුම අයදුම්කරුවන් වෙත කල්වේලා ඇතිව ඒ බව දැනුම් දෙනු ලැබේ)

8.3 ලිඛිත පරීක්ෂණයෙන් ලබාගත් ලකුණු හා සම්මුඛ පරීක්ෂණයක් මගින් විවිධ ක්ෂේත්‍ර/විශේෂීකරණය සඳහා ආධුනිකයින් තෝරාගනු ඇත.

8.4 නාවික ඉංජිනේරු ක්ෂේත්‍රය සඳහා තෝරාගනු ලැබූ අයදුම්කරුවන් ඔවුන් එම ක්ෂේත්‍රයේ ලියාපදිංචි වීමට පෙර ඔවුන්ගේ වියදමින් වෛද්‍ය පරීක්ෂණයකට භාජනය විය යුතුය.

9. *අයදුම්පත් :*

9.1 අයදුම්පත් සහ ආයතනය පිළිබඳ වැඩි විස්තර www.iet.edu.lk යන වෙබ් අඩවියෙන් ලබා ගත හැක. තවද,

9.2 කටුනායක, පන්සල පාරේ, ඉංජිනේරු තාක්ෂණ ආයතනයට පැමිණ රු. 50ක් ගෙවීමෙන් හෝ තැපෑලෙන් අවශ්‍ය නම් රු. 50ක් වටිනා මුදල් ඇණවුමක් සහ මුද්දර ගැසූ ලිපිනය ලියන ලද අඟල් 9X4 ප්‍රමාණයේ ලියුම් කවරයක් ලේඛකාධිකාරී, ඉංජිනේරු තාක්ෂණ ආයතනය, පන්සල පාර, කටුනායක දුරකථන අංක : (011-2252833, 011-2252834) යන ලිපිනයට එවීමෙන් 2008 ජූනි 16 වන දින දක්වා අයදුම්පත් ලබාගත හැක.

9.3 මෙයට අමතරව පහත දැක්වෙන ප්‍රධාන කාර්යාලය, ජාතික ආයතන සහ පළාත් කාර්යාල වලට පැමිණ රු. 50ක් ගෙවීමෙන් ද, 2008 ජූනි 16 වන දින දක්වා අයදුම්පත් මිලදී ගත හැක.

(i) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය, 971, ශ්‍රී ජයවර්ධනපුර මාවත, වැලිකඩ, රාජගිරිය.
දුරකථන : 011-2863680, 011-2867435

(ii) ආධුනිකත්ව අභ්‍යාස ආයතනය, 581, ගාලුපාර, කටුබැද්ද, මොරටුව.
දුරකථන : 011-2647393, 011-2641092

(iii) මෝටර් රථ ඉංජිනේරු අභ්‍යාස ආයතනය, 07,දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, ඔරුගොඩවත්ත, වැල්ලම්පිටිය.
දුරකථන : 011-2572977, 011-2532182

(iv) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය, ඌව පළාත් කාර්යාලය, 288, කුමාරසිංහ මාවත, පස්සර පාර, බදුල්ල.
දුරකථන : 055-2222608

(v) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය, සබරගමුව පළාත් කාර්යාලය, නව කොළඹ පාර, විද්‍යාල මාවත, නව නගරය, රත්නපුර.
දුරකථන : 045-2228667

(vi) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය,දකුණු පළාත් කාර්යාලය, 27ඒ, විවෘත විශ්වවිද්‍යාල මාවත, නූපේ, මාතර.
දුරකථන : 041-2226958

(vii) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය, මධ්‍යම පළාත් කාර්යාලය, අංක 108/2බී, තිවංක බෝධි මාවත, මුල්ගම්පොළ, මහනුවර.
දුරකථන : 081-2201918

(viii) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය, උතුරු මැද පළාත් කාර්යාලය, දෙවන පියවර, 525/2, මෛත්‍රීපාල සේනානායක මාවත, අනුරාධපුරය.
දුරකථන : 025-2225504

(ix) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය, වයඹ පළාත් කාර්යාලය, ජාතික තරුණ සේවා සභාව අසල, මීගමුව පාර, මල්කඩුවාව, කුරුණෑගල.
දුරකථන : 037-2221865

(x) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය, උතුරු පළාත් කාර්යාලය, අංක 07, කෝවිල පාර, යාපනය.
දුරකථන : 021-2222383

(xi) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය, නැගෙනහිර පළාත් කාර්යාලය, අංක 07, ග්‍රාමසේවක පාර, කල්මුනේ කුඩි 13, කල්මුනේ.
දුරකථන : 067-2229357

(xii) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු අධිකාරිය, බස්නාහිර පළාත් කාර්යාලය, 242, හැව්ලොක් පාර, කොළඹ 05.
දුරකථන : 011-2597671-2, 011-2587258

9.4 සෑම අයදුම්කරුවෙකු විසින්ම තම අයදුම්පත ඉදිරිපත් කිරීමේදී රු. 300ක මුදලක් (9.5 ප්‍රකාර) ගෙවිය යුතුය. මෙම මුදල දිවයිනේ පිහිටි මහජන බැංකුවේ ඕනෑම ශාඛාවකට ගෙවිය හැකිය.

9.5 මුදල් තැන්පතු තුණ්ඩුව පහත සඳහන් කරුණු සහිතව නිසි පරිදි සම්පූර්ණ කළ යුතුය :

(i) ශාඛා අංකය සහ ගිණුම් අංකය -174-100170347379
(ii) බැර උපදෙස් - මහජන බැංකුව, නුගේගොඩ, ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරියේ රැස් කිරීමේ ගිණුම් අංක 174-100170347379ට බැර පිණිස
(iii) අයදුම්කරුගේ නම සහ ලිපිනය

9.6 නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත, මුදල් ගෙවීම් කරන ලද බැංකු ශාඛාවේ බලයලත් නිලධාරියෙකු විසින් සහතික කරන ලද තැන්පතු රිසිට්පත, අයදුම්පත සමග අමුණා 2008 ජූනි 20 වැනි දින හෝ ඊට ප්‍රථම ලියාපදිංචි තැපෑලෙන් අධ්‍යක්ෂ/විදුහල්පති, ඉංජිනේරු තාක්ෂණ ආයතනය, පන්සල පාර, කටුනායක යන ලිපිනයට එවිය යුතුය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් හෝ අතින් ගෙනැවිත් භාර දෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

9.7 රජයේ කාර්මික ආයතනයක හෝ විශ්වවිද්‍යාලයක පූර්ණ කාලීන ඩිප්ලෝමා පාඨමාලාවක් හෝ උපාධිය හැදෑරූ හෝ හදාරමින් සිටින අය හෝ අයැදුම්කිරීමට සුදුසුකරුවන් නොවේ.

9.8 අයැදුම්පත සමග සහතික වල මුල් පිටපත් හෝ ඡායා පිටපත් එවිය යුතු නැත.

9.9 අයැදුම්පත් ලැබුණු බවට අයදුම්කරුවන්ට දැනුම් දෙනු නොලැබේ.

9.10 ඉහත අංක 9.2 හි සඳහන් මුදල් ඇණවුම් ගණකාධිකාරි, ඉංජිනේරු තාක්ෂණ ආයතනය නමින් ලබාගත යුතු අතර ගෙවීම් කරන තැපැල් කාර්යාලය කටුනායක විය යුතුය.

10. තැපෑලේ දී නැතිවන හා ප්‍රමාද වන අයැදුම්පත් සම්බන්ධයෙන් ඉංජිනේරු තාක්ෂණ ආයතනය වග කියනු නොලැබේ. ප්‍රමාදයන් වලක්වා ගැනීම සඳහා කල් ඇතිව සිය අයැදුම්පත් ඉදිරිපත් කරන ලෙස අයැදුම්කරුවන්ට විශේෂයෙන් දන්වා සිටිනු ලැබේ.

සභාපති,
ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය.

අංක 971,
ශ්‍රී ජයවර්ධනපුර මාවත,
වැලිකඩ, රාජගිරිය.

04-612

---

## මොරටුව විශ්වවිද්‍යාලීය තාක්ෂණික ආයතනය

### ජාතික තාක්ෂණික ඩිප්ලෝමා පාඨමාලාව සඳහා සිසුන් ඇතුළත්කර ගැනීම - 2008/2009

මොරටුව විශ්වවිද්‍යාලයට අයත් තාක්ෂණික ආයතනය මගින් පවත්වනු ලබන තුන් අවුරුදු පූර්ණ කාලීන ජාතික තාක්ෂණික ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරීම පිණිස සුදුසුකම් ලත් අපේක්ෂකයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම පාඨමාලාව, මොරටුව විශ්වවිද්‍යාලයීය තාක්ෂණික ආයතනය නව පරිශ්‍රය දියගම, හෝමාගම ස්ථාපනය කරන තෙක් මොරටුව විශ්වවිද්‍යාලයීය පරිශ්‍රය තුළ පැවැත්වෙනු ඇත.

1. *සාමාන්‍ය :*

ජාතික තාක්ෂණික ඩිප්ලෝමා පාඨමාලාව දෑවුරුදු අධ්‍යයන හා එක් අවුරුදු ප්‍රායෝගික යන්ත්‍රාගාර පුහුණුවකින් ද සමන්විත වේ. පාඨමාලාව ඉංග්‍රීසි මාධ්‍යයෙන් පමණක් පැවැත්වේ.

මෙම පාඨමාලාවේ දී පහත සඳහන් විෂය ක්ෂේත්‍රයන් හැදෑරීමට අවස්ථාව ලැබේ :

(i) රසායන ඉංජිනේරු තාක්ෂණය
(ii) සිවිල් ඉංජිනේරු තාක්ෂණය
(iii) විදුලි ඉංජිනේරු තාක්ෂණය
(iv) ඉලෙක්ට්‍රොනික් හා විදුලි සංදේශ ඉංජිනේරු තාක්ෂණය
(v) නාවුක ඉංජිනේරු තාක්ෂණය
(vi) යාන්ත්‍රික ඉංජිනේරු තාක්ෂණය
(vii) නෞකා චාලන අධ්‍යයන හා තාක්ෂණය
(viii) පොලිමර් තාක්ෂණය
(ix) පේෂකර්ම හා ඇඟලුම් තාක්ෂණය

2. *යෝග්‍යතාවය :*

2.1 *වයස :*

(අ) 2007.12.31 දිනට අයදුම්කරුගේ වයස අවුරුදු 24 නොඉක්ම විය යුතුය.

(ආ) නෞකා චාලන අධ්‍යයන තාක්ෂණය හා නාවුක ඉංජිනේරු තාක්ෂණය යන පාඨමාලාවන් හැදෑරීමට අපේක්ෂකයන් තෝරා ගැනීමේ දී 2007.12.31 දිනට වයස අවුරුදු 20ට අඩු අයදුම්කරුවන්ට ප්‍රමුඛත්වය දෙනු ලැබේ.

(ඇ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ ඇති ඕනෑම විශ්වවිද්‍යාලයක (විවෘත විශ්වවිද්‍යාලය හැර) හෝ උසස් අධ්‍යාපන ආයතනයක පූර්ණ කාලීනව ලියාපදිංචි වී ඇති සිසුන් හා වෙනත් පිළිගත් උසස් අධ්‍යාපන ආයතනයක පූර්ණකාලීනව ලියාපදිංචි වී ඇති සිසුන් මෙම පාඨමාලාව සඳහා අයදුම් කිරීමට සුදුසුකම් නොලබයි.

2.2 *අධ්‍යාපන සුදුසුකම් :*

(අ) අයදුම්කරුවන් ශ්‍රී ලංකා විභාග කොමසාරිස් ජනරාල් විසින් 2005 හෝ 2006 හෝ 2007 වසරේ පවත්වන ලද අ. පො. ස. (උ. පෙළ) විභාගයේ දී එකවර පහත සඳහන් විෂයයන්ගෙන් 03ක් සමත්විය යුතුය :

(i) භෞතික විද්‍යාව
(ii) රසායන විද්‍යාව
(iii) සංයුක්ත ගණිතය
(iv) උසස් ගණිතය

3. *තෝරා ගැනීමේ පදනම / ක්‍රියාපරිපාටිය :*

3.1 *පාඨමාලාවට ඇතුළත් කර ගැනීම :*

ශිෂ්‍යයන් තෝරා ගැනීම අ. පො. ස. (උ.පෙළ) විභාගයේ ප්‍රතිඵල හා මොරටුව විශ්ව විද්‍යාලයේ තාක්ෂණික ආයතනය මගින් පැවැත්වෙන යෝග්‍යතා පරීක්ෂණයේ සාමාර්ථය මත සිදුවේ.

යෝග්‍යතා පරීක්ෂණය සමත් වූ ශිෂ්‍යයන් අතරින් අ. පො. ස. (උ. පෙළ) විභාග ලකුණුවල කුසලතාවය මත සිසුන් තෝරාගනු ලැබේ. (Z ලකුණු මත). 40% ක් අ. පො. ස. (උ. පෙළ) විභාගයේ කුසලතාවය මත හා 60%ක් දිස්ත්‍රික් පදනම මත ශිෂ්‍යයන් තෝරාගැනීම සිදුවේ.

3.2 *අධ්‍යයන ක්ෂේත්‍රය :*

යෝග්‍යතා පරීක්ෂණයේ ලකුණු හා අයදුම්කරුගේ එක් එක් ක්ෂේත්‍රය සඳහා දක්වන කැමැත්තේ අනුපිළිවෙල, අධ්‍යයන ක්ෂේත්‍රය තෝරා ගැනීමේ දී සැළකිල්ලට භාජනය කරනු ලැබේ.

4. *අයදුම් කිරීමේ පිළිවෙල :*

4.1 *අයදුම්පත් පෝරම :*

(i) *ගැසට් නිවේදනයේ දක්වා ඇති ආදර්ශ අයදුම්පතට අනුකූලව* ඉංග්‍රීසි භාෂාවෙන් පිළියෙල කරන ලද අයදුම්පතක් ඉදිරිපත් කළ යුතුය.

ආදර්ශ අයදුම්පත පහත සඳහන් අන්තර්ජාල වෙබ් අඩවියට පිවිසීමෙන් ද ලබාගත හැක.

**http://www.mrt.ac.lk/itum**

(ii) සම්පූර්ණ කරන ලද අයදුම්පත බහාලන ලියුම් කවරයේ ඉහළ වම්පස කෙළවරේ "ජාතික තාක්ෂණ ඩිප්ලෝමා පාඨමාලාවට ඇතුළත් වීම - 2008/2009" යනුවෙන් සඳහන් කර ලියාපදිංචි තැපෑලෙන් පහත සඳහන් ලිපිනයට එවිය යුතුය.

"නියෝජ්‍ය ලේඛකාධිකාරී, තාක්ෂණික ආයතනය, මොරටුව විශ්වවිද්‍යාලය, කටුබැද්ද, මොරටුව".

(iii) තම ලිපිනය ලියන ලද මුද්දර ඇල වූ 9"x4" ප්‍රමාණයේ ලියුම් කවර දෙකක් ද අයදුම්පත සමඟ එවිය යුතුය.

(iv) අයදුම්පත සමඟ සහතිකවල මුල් පිටපත් හෝ පිටපත් එවීම අවශ්‍ය නොවේ. එහෙත් අයදුම්පතේ සඳහන් තොරතුරු අදාළ පරිදි සහතික කර තිබිය යුතුය. (අයදුම්පතේ 06, 07 සහ 08 යන ඡේද බලන්න.)

4.2 *අධ්‍යයන ක්ෂේත්‍රයන් තෝරා ගැනීම :*

(i) මෙම පාඨමාලාව අධ්‍යයන ක්ෂේත්‍ර කාණ්ඩ දෙකකින් සමන්විත වේ.

(ii) නාවික අධ්‍යයන ක්ෂේත්‍ර කණ්ඩය (SET 1) හෝ අනිකුත් ක්ෂේත්‍ර කාණ්ඩය (SET 2) හෝ ක්ෂේත්‍ර කාණ්ඩයන් දෙකම සඳහා ඉල්ලුම් කළ හැක. ක්ෂේත්‍ර කාණ්ඩයන් දෙකම සඳහා අයදුම් කරන්නේ නම් ප්‍රමුඛතාවය සඳහන් කළ යුතුය.

(iii) නාවික අධ්‍යයන ක්ෂේත්‍ර කාණ්ඩයේ දී එනම් නාවුක ඉංජිනේරු තාක්ෂණය සහ නෞකා චාලන අධ්‍යයන තාක්ෂණය (SET 1) සඳහා ප්‍රමුඛතාවය සඳහන් කිරීමේ දී වඩාත් කැමති ක්ෂේත්‍රය 01 ලෙස ද අනෙක් ක්ෂේත්‍රය 02 ලෙස ද සඳහන් කළ යුතුය.

(iv) අනිකුත් ක්ෂේත්‍ර කාණ්ඩය (SET 2) සඳහා ප්‍රමුඛතාවය 1,2,3,4,5,6,7 සඳහන් කළ යුතු අතර වඩාත් කැමති ක්ෂේත්‍රය 01 ලෙස ද, ඊළඟ ක්ෂේත්‍රය 02 ලෙස ද, අන්තිම ක්ෂේත්‍රය 07 ද ලෙස සඳහන් කළ යුතුය.

5. *ඉල්ලුම්පත්‍ර ගාස්තු :*

(i) ඉල්ලුම්පත්‍ර ගාස්තු වශයෙන් එක් ක්ෂේත්‍රයක් සඳහා රු. 200.00 (දෙසීයක්) හෝ ක්ෂේත්‍රයන් දෙකටම රු. 400.00 (හාරසීයක්) ගෙවිය යුතු අතර, එම ගෙවීම ලංකා බැංකුවේ ඕනෑම ශාඛාවකින් "මොරටුව විශ්වවිද්‍යාලයීය තාක්ෂණික ආයතනය - ලංකා බැංකුවේ කටුබැද්ද ශාඛාවේ ගිණුම් අංක 0000308280" දරන ගිණුමට බැර වනසේ ගෙවිය යුතුය. මෙම අයදුම්පත් ගාස්තු ආපසු ගෙවනු නොලැබේ.

(ii) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය 2008.05.26 දින වේ.

6. *යෝග්‍යතා පරීක්ෂණය :*

අ. පො. ස. (උ. පෙළ) විභාගයේ ප්‍රතිඵල මත එක් එක් දිස්ත්‍රික්කයට අදාළ ලකුණු කළ සිසුන් ප්‍රමාණය, මොරටුව විශ්වවිද්‍යාලයේ තාක්ෂණික ආයතනය මගින් පවත්වනු ලබන යෝග්‍යතා පරීක්ෂණයට කැඳවනු ලැබේ.

7. *පාඨමාලාව සඳහා ලියාපදිංචි කිරීම :*

(i) යම් පාඨමාලාවක් සඳහා තෝරා ගන්නා ලද අපේක්ෂකයන්, පාඨමාලාව සඳහා ලියාපදිංචි කරනු ලබන දින, පහත සඳහන් සහතිකවල මුල් පිටපත් ඉදිරිපත් කළ යුතුය :

- අ. පො. ස. (උ. පෙළ) සහතිකය
- අ. පො. ස. (උ. පෙළ) Z ලකුණ සඳහන් සහතිකය
- පාසැල් හැරයාමේ සහතිකය
- උප්පැන්න සහතිකය
- නමේ වෙනසක් ලියකියවිලිවල හා සහතිකපත්වල ඇත්නම් දිවුරුම් ප්‍රකාශයක්

(ii) ජාතික තාක්ෂණික ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරීම සඳහා ලියාපදිංචි වන කිසිම අපේක්ෂකයකු, එම පාඨමාලාවේ කාලසීමාව තුළ දී, මෙම විශ්වවිද්‍යාලයේ වෙනත් පාඨමාලාවක් හෝ ශ්‍රී ලංකාවේ පිහිටා ඇති අන් කිසිම විශ්වවිද්‍යාලයක පාඨමාලාවක් හෝ වෙනත් උසස් අධ්‍යාපන ආයතනයක පාඨමාලාවක් හැදෑරීමට සුදුසුකම් නොලබයි. (විවෘත විශ්ව විද්‍යාලය හැර)

(iii) ජාතික තාක්ෂණික ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරීම සඳහා ලියාපදිංචි වන කිසිම අපේක්ෂකයකු, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ ඇති කිසිම විශ්වවිද්‍යාලයක (විවෘත විශ්වවිද්‍යාලය හැර) හෝ උසස් අධ්‍යාපන ආයතනයක පූර්ණ කාලීනව ලියාපදිංචි වී ඇති සිසුන් මෙම පාඨමාලාව සඳහා අයදුම් කිරීමට සුදුසුකම් නොලබයි.

අධ්‍යක්ෂ,
මොරටුව විශ්වවිද්‍යාලයීය තාක්ෂණික ආයතනය.

2008 අප්‍රේල් මස 11 වැනි දින.
මොරටුව විශ්ව විද්‍යාලය,
කටුබැද්ද,
මොරටුව.

| *For office use only* | |
|---|---|
| *Application No.* | *District* |
| | |

SPECIMEN APPLICATION FORM

Application For Admission to the National Diploma in Technology Course Institute of Technology, University of Moratuwa

Academic Year – 2008/2009
Application For

(a) Maritime Fields (Set 1) ☐ Please tick ( √ )
One or Both
(b) Other Fields (Set 2) ☐

(All cages must be completed in **English BLOCK CAPITALS** only)

01. Name with Initials : ☐☐☐☐☐☐☐☐☐
☐☐☐☐☐☐☐☐☐☐☐☐☐☐☐☐

02. Contact Address : ...............................................................
..............................................................
Telephone No.: ......................................
(Please enclose two self-addressed 9" x 4" Stamped envelopes)

| 03. Date of Birth : | | | 04. Sex : | Please tick (✓) |
|---|---|---|---|---|
| Year | Month | Date | Male | Female |
| | | | | |

Age as at 31.12.2007 :

| Years | Months | Days |
|---|---|---|
| | | |

05. National Identity Card No.:

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

06. Results of G. C. E. (Advanced Level) Examinations :

| Subjects & Details of Examination | Grades & Details obtained at the | | |
|---|---|---|---|
| | 1st attempt Year : 2005 | 2nd attempt Year : 2006 | 3rd attempt Year : 2007 |
| Physics | | | |
| Chemistry | | | |
| Combined Mathematics | | | |
| Advanced Mathematics | | | |
| Index No. | | | |
| Medium (Sinhala or Tamil) | | | |
| Z-Score | | | |

| Results of year to be considered for Selection (indicate whether 2005 or 2006 or 2007) | |
|---|---|

07. School(s) attended from Year 11 to 13 :

| Year | Name & Address of School | Administrative District | Period of Attendance | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | From | | | To | | |
| | | | Y | M | D | Y | M | D |
| 11 | | | | | | | | |
| 12 | | | | | | | | |
| 13 1st Attempt | | | | | | | | |
| 2nd Attempt | | | | | | | | |
| 3rd Attempt | | | | | | | | |

08. Certification of Results and School attended :

It is compulsory to certify the results under No. 06 and details under No. 07 in the application by the School Principal for the School Candidates and by a Justice of Peace for External Candidates.

I certify that the particulars given above by the candidate in the cage 6 and 7 are true and accurate according to their Original certificates.

Name of the Principal/Justice of the peace : Rev./Dr./Mr./ Mrs. ..................................................................................

Office Stamp

......................., .....................
Signature. Date.

09. Field Preference : (*See instruction)

| Set 1 | |
|---|---|
| Maritime Fields | Prefer. |
| Marine Engineering Technology | |
| Nautical Studies and Technology | |

(Special Medical Test and Interview for SET 1)

| State Priority, if applied for both sets | SET 1 | |
|---|---|---|
| | SET 2 | |

Please tick (✓)

| Set 2 | |
|---|---|
| Other Fields | Prefer |
| Chemical Engineering Technology | |
| Civil Engineering Technology | |
| Electrical Engineering Technology | |
| Electronics & Telecom Eng. Technology | |
| Mechanical Engineering Technology | |
| Polymer Technology | |
| Textile & Clothing Technology | |

10. Are you registered as a fulltime student in any other university under the UGC (other than Open University) or any Higher Educational Institution under the Ministry of Higher Education ?

| Yes | No. |
|---|---|
| | |

11. Applicant's Declaration :

(i) I declare that I am not a fulltime registered student at any University (except Open University of Sri Lanka) or any Higher Educational Institution under the Ministry of Higher Education.

(ii) I certify that all the particulars given by me in this application are true and accurate. I am aware that if any particulars given by me in this application are found to be false or inaccurate prior to my admission, my application will be rejected and that if such information is found to be false or inaccurate after my admission, I will be discontinued from the course.

(iii) In the event of my being selected for admission after the Test, I shall abide by the Statutes, By-Laws, Regulations and Rules of the Institute of Technology, University of Moratuwa in so far as they are applicable to me.

(iv) I am aware that if I am found to be registered in another University (expect Open University) or any other Higher Educational Institution under the Ministry of Higher Education for over 30 days at the time of sitting for the Aptitude Test for the National Diploma in Technology Course, I will not be selected for the Course.

| Paste your Cash Deposit/Cash Transfer Original Slip here. |
|---|

————,
Signature of Applicant.

04-715

Date :————.